**අක්කරෙයි පත්තු මහ නගර සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**----------------------**

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජූනි 05 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 21 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 සැප්තැම්බර් 21 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට අක්කරයි පත්තු මහ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවල අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිතිවලට අනුකූලවීම
---------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 2 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශ ඉදිරිපත් කරයුතු වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශ ඉදිරිපත්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මහජන පුස්තකාලය සඳහා මහනගර සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබූ රු. 400,000 ක් වටිනා පුස්තකාල පොත් 1077 කම ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) ප්‍රතිසංස්කරණ කටයුතු නිමකර 2014 දෙසෙම්බර් 15 දින මහ නගර සභාව වෙත භාරදී තිබූ ගොඩනැගිලි සංකීර්ණය සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවියයුතු රු. 500,000 ක මුදල ගිණුම්වල පෙන්වා නොතිබුණි.

(ඇ) මහනගර සභාවට අයත් ෆැක්ස් යන්ත්‍ර 04 ක්, ලැප්ටොප් පරිඝණක 03 ක්, වතුර පොම්ප 06 ක් ඕවර් හෙඩ් ප්‍රොජෙක්ටර් (Over Head Projector) 03 ක වටිනාකම තක්සේරුකර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී සභාවේ බැකෝ යන්ත්‍රය පුද්ගලික කොන්ත්‍රාත්කරුන් වෙත බදු දී එය පැය 19 ක් වැඩකර තිබුණද, ඒ වෙනුවෙන් ලැබියයුතු රු. 48,450 ක් බදු ආදායම් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඉ) 2014 දෙසැම්බර් 31 දිනට ඉතිරි කිරීම් ගිණුම් දෙකක ඉතිරිය රු. 70,682 ක් තිබුණද මූල්‍ය ප්‍රකාශවල රු. 67,598 ක් ලෙස දක්වා තිබීමෙන් බැංකු ශේෂය රු. 3,084 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2014 දෙසැම්බර් 31 දිනට තොග ලේඛනය අනුව තිබූ රු. 36,000 ක් වටිනා කොම්පොස් පොහොර බෑග් 180 ක වටිනාකම් ගිණුම්වල පෙන්වා නොතිබුණි.

(උ) මහ නගර සභාවේ රු. 14,305,446 ක වටිනා ස්ථාවර තැන්පත් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලද පොලී ආදායම් රු. 475,805 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඌ) සභාව සතු වාහන 09 ක වටිනාකම් තක්සේරුකර වත්කම් ගිණුම්වලට ගෙන නොතිබුණි.

1.3.3 ලැබියයුතු ගිණුම්

(අ) ප්‍රජා ශාලාවට ලබා දී තිබූ රු. 4,800 ක අත්තිකාරම් මුදල නිරවුල් කිරීමට කටයුතු නොකර වසර ක් 05 දිනටම මුල්‍ය ප්‍රකාශ වල දක්වා තිබුණි.

(ආ) වර්ෂ දෙකකට පෙර සේවයෙන් පහකළ නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවියයුතු රු. 17,200 ක ණය ශේෂය අයකර ගැනීම් සඳහා 2015 ජූලි 24 දිනය දක්වා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණන සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන එක්එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් පෙන්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයන් | වටිනාකම් රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 150,369,889 | ස්ථාවර වත්කම් ලේඛන සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ලීබඩු සහ සවි කිරීම් | 3,798,263 | |
| මෝටර් රථ හා කරත්ත | 6,440,748 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| පුස්තකාල පොත් | 2,069,825 | |

1.3.5 නීති, රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මහ නගර සභා ආඥා පනත | |
| 252 වන පරිච්ඡේදයේ 218 වන වගන්තිය | කොමසාරිස් විසින් ඔහුගේ පරිපාලනය සම්බන්ධයෙන් එක්එක් ගිණුම් වර්ෂය වෙනුවෙන් පිළියෙල කලයුතු වාර්ෂික පරිපාලන වාර්තාව 2014 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර ඉදිරපත් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (I) මු.රෙ. 137 | මහ නගර සභාවේ නාගරිකකොමසාරිස්ගේ අනුමැතිය ලබා නොගෙන පුවත්පත් ප්‍රචාරක ගාස්තු සඳහා රු. 92,736 ක් වැය කර තිබුණි. |
| (II) මු.රෙ. 138 | සමාලෝචිත වර්ෂයේදී රු. 87,340 ක ගෙවීම් වවුචර් 08 ක් එකතු වටිනාකම් සහතික කර නොතිබුණි |

| | | |
|---|---|---|
| (III) | මු.රෙ. 452 (I) | සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ වලදී නිකුත්කරන ලද සඳහා යවන විගණන විමසුම් 07 ක් විගණන විමසුම් ලේඛනයේ සටහන් කර නොතිබුණි. |
| (IV) | මු.රෙ. 571 | 02 සිට වර්ෂ 05 ඉක්මවූ රු. 989,162 ක් වටිනා කල්ඉකුත්වූ ආපසු ගෙවියයුතු තැන්පත් 36 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතුකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2002 අංක 14 දරන වැට් බදු පනත | 2012 වර්ෂයේ සහ ඊට පෙර වර්ෂවලටත් අදාලව සභාව විසින් කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගෙන තිබූ වැට් බදු රු. 696,670 ක් දේශිය ආදායම් දෙපාර්තුමෙන්තුව වෙත යැවීම සඳහා 2015 ජුලි 24 වන දිනය දක්වා කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 1992 අගෝස්තු 19 දිනය හා අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව විසින් ධාවනයේ යොදවන ලබන වාහන 10 ක රාජ්‍ය ලාංජන යොදා නොතිබුණි. |
| (ඉ) | 2014 දෙසැම්බර් 26 දිනය හා අංක 8/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපිය | වාහන 23 ක රක්ෂණ ආවාරණ ලබා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයෙදී සභාව විසින් කටයුතු කර නොතිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 17,592,793 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 12,545,325 ක් විය. මෙය මූල්‍ය ප්‍රතිඵලයේ රු. 5,047,468 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

### 2.2 ආදායම් පරිපාලනය

---------------------

#### 2.2.1 වරිපනම් බදු

--------------

මහ නගර සභා ආඥා පනතේ 252(1)(ආ) වගන්තිය අනුව සභා බල ප්‍රදේශයේ දේපල හිමියන් 12,872 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය සඳහා අයවියයුතු රු. 10,000,000 ක වරිපනම් බදු අයකර ගැනීම් සඳහා බදු අයකරන නිලධාරි 05 දෙනෙකු භාරදී තිබුණි. කෙසේවුවද රු. 4,897,883 ක් පමණක් අයකර ගෙන තිබුණි.

(අ) බලපත්‍ර ගාස්තු

---------------

1992 වර්ෂය සිට 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය දක්වාවූ කාල පරිච්ඡේදය සඳහා අයවියයුතු මහජන පොල වෙළඳ සංකීර්ණයේ හිඟ කඩ කාමර බදු රු. 556,607 ක්ද, බස් නැවතුම් පොල වෙළඳ සංකීර්ණයේ හිඟ කඩ බදු රු. 2,080,000 ක්ද, හිඟ මස් කඩ කුලි

රු. 3,159,412 ක්ද, මාලු වෙළඳ සැල සහ පොදු වෙළඳ පොල හිඟ බදු කුලී රු. 1,003,920 ක් ඇතුළුව මුළු එකතුව රු. 6,799,939 ක හිඟ ආදායම් අයකර ගැනීම සඳහා ලේකම් විසින් නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි.

(ආ) දුරකථන කුළුනු සඳහා ගාස්තු
--------------------------------

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 වන වගන්තිය සමග කියවියයුතු ඉහත පනතේ 21 වන වගන්තිය යටතේ නාගරික සංවර්ධන සහ පූජා භූමි සංවර්ධන අමාත්‍යවරයා විසින් සකස්කරන ලද රීති 1 (V) වගන්තිය අනුව සංනිවේදන ආයතනවලින් ස්ථාපිත කරන ලද සන්නිවේදන කුළුනු 02 කින් සමාලෝචිත වර්ෂය සඳහා ගාස්තු අයකර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 මෙහෙයුම් දුර්වලතා
----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතන සංග්‍රහයේ XXVIII පරිච්ඡේදයේ 1.3 වගන්තිය අනුව එක් එක් නිලධාරින්ගේ පැමිණීම සහ පිටත්වීම පැමිණීමේ ලේඛනයේ සටහන් කර අත්සන් කළයුතු වුවද මහ නගර සභාවේ වෛද්‍ය නිලධාරි තමාගේ පැමිණීම පැමිණීමේ ලේඛනයේ අත්සන තබා නොතිබුද සමාලෝචිත වර්ෂයේ වැටුප් හා දීමනා වශයෙන් රු. 630,072 ක් ගෙවා තිබුණි.

(ආ) සභාව විසින් 2012 වර්ෂයේ පත්වීම් ලබා ඉන් සෞඛ්‍ය කම්කරු, මුරකරු සහ කාර්යාල කාර්ය සහායක් යන එකතුව සෙවකයින් 70 දෙනෙකුට පත්වීම් දින සිට වැටුප් වර්ධක ලබා දී නොතිබුණි.

(ඉ) 2001/15 අංක දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව නිලධාරින් 25 දෙනෙකුට වඩා වැඩි රජයේ කාර්යාලවල ඇඟිලි සලකුන යොදන යන්ත්‍ර භාවිතා කළයුතුබව සඳහන් කර තිබුණද නිලධාරින් 130 ක් සේවය කරන මහ නගර සභාවේ ඇඟිලි සැලකුණ යොදන යන්ත්‍ර භාවිතා කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-----------------------------

(i) වෙළඳ බලපත්‍ර ගාස්තු
------------------------

මහ නගර සභාව විසින් මහ නගර සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යන වෙළඳ ආයතන 750 කින් රු. 1,500,000 ක වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීම සඳහා ඇස්තමේන්තු කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී එම ආයතනවලින් රු. 1,248,750 ක ආදායමක් පමණක් අයකර ගෙන තිබුණි.

(ii) කඩ කාමර බදු
----------------

මහ නගර සභාවට අයත් කඩ කාමර 96 කින් සමාලෝචිත වර්ෂයේදී කඩ කාමර 53 ක් පමණක් බදු දී රු. 159,000 ක ආදායමක් ලබාගෙන තිබුණද, ඉතිරි කඩ කාමර 43 බදු දීමට කටයුතු නොකිරීමෙන් සභාවට රු. 129,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

3.3 නිෂ්ක්‍රිය වත්කම්

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතු අළුත්වැඩියාකර ප්‍රයෝජනයට ගත හැකි තත්වයේ ට්‍රැක්ටර් රථ 04 ක්, ටේලර් 02, ඩබල් කැප් මෝටර් රථක් සහ එස්සවේටර් යන්ත්‍ර 01 ඇතුළුව එකතුව වාහන 08 ක් අළුත්වැඩියා කිරීමකින් තොරව වර්ෂ දෙකකට වැඩි කාලයක් නිෂ්ක්‍රියව පැවතුනි.

(ආ) නගර මැද පිහිටි අක්කර 01 ක ප්‍රමාණයේ හිස් ඉඩමක් රු. 6,400,000 ක මුදලට 2010 වර්ෂයේ මිලදී ගෙන තිබුණි. එම ඉඩම් මෙතෙක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

3.3 මානව සම්පත් කළමණාකරණය

------------------------------------

විධායක තනතුරේ පුරප්පාඩු තුනක්ද, කළමණාකරණ සහායක තනතුරේ පුරප්පාඩු පහක් සුළු සේවක තනතුරුවල පුරප්පාඩු එකොළහක් වර්ෂ 5 ක කාලය සිට පුරප්පාඩුව පැවතුනි.

4 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

------------------------

එක් එක් පළාත් පාලන ආයතන තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක පිහිටුවා ගත යුතු බව පළාත් හා සභ පළාත් පාලන අමාත්‍යංශයේ 2005 නොවැම්බර් 08 වන දින හා අංක 03 දරණ පළාත් පාලන ප්‍රතිසංස්කරන පිළිබඳ චක්‍රලේඛයේ 8 වන ඡේදයෙන් පෙන්වාදී තිබු පරිදි සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

4.2 අයවැය පාලනය

-------------------

අයවැයගත වියදම් සහ තත්‍ය ආදායම් අතර 25% සිට 123% දක්වා විචලනයක් නිරීක්ණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් වශයෙන් යොදාගෙන ඇති බවත් නිරීක්ෂණය නොතිබුණි.

5 පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් රැස්කිරීම්

(ඇ) අයවැය පාලනය

(ඈ) ස්ථාවර වත්කම් පාලනය